[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 10 ශ්‍රේණිය | විෂයය - නර්තනය | පත්‍රය I | පැය - 01 යි. |

නම ……………………………………………………………

**සැලකිය යුතුයි :-**

- සියලුම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30 ටම පිළිතුරු සැපයිය යුතුයි. එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
- II හා III වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුය.
  ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතුය.

---

## I කොටස

**අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.**

(1) තාලය තැබීමට යොදාගන්නා ඝන වාද්‍ය භාණ්ඩ වේ.
1) තාලම්පට, ගැටබෙරය, හක්ගෙඩිය
2) තාලම්පට, පංතේරුව, අත්මිණිය
3) තාලම්පට, බුම්මැඩිය, හක්ගෙඩිය
4) තාලම්පට, උඩැක්කිය, තලිය

(2) ශෝකය නැමැති ස්ථායි භාවය හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණය වන්නේ,
1) වැලපීම, කඳුළු සැලීම, පවන් සැලීම
2) සුසුම්ලෑම, කඳුළු සැලීම, වැලපීම
3) වැලපීම, උගුර කට වියලීම, උඩපැනීම
4) අතපය අප්‍රාණික වීම, ඔල්වරසන්දීම, හැඩීම

(3) ගැටබෙරයේ බෙර ඇසෙහි ප්‍රමාණය දැක්වෙන සාම්ප්‍රදායික මිනුම් ක්‍රමය වන්නේ,
1) වියතකි 2) රියනකි 3) විග්ගුස්සකි 4) තුනඟුලකි

(4) මෙරට දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටුම් ඉදිරිපත් කළ බවත් සඳහන්ව ඇත්තේ,
1) කොරවක්ගල ලෙන් ලිපියේය 2) සැස්සේරුව සෙල්ලිපියේය
3) පාලමොට්ටායි සෙල්ලිපියේය 4) කාලිංග වනෝද්‍යාන සෙල්ලිපියේය

(5) මේවා අනුපිළිවෙලින් කළ හා ලී කෙළි නැටුම් වලට සමානකම් දක්වන දෙමළ ගැමි නැටුම් වේ.
1) සෙබ්මු හා කෝලාට්ටම් 2) කොරති හා සෙම්බු
3) කෝලාට්ටම් හා කුම්මි 4) චෙම්බු හා කුම්මි

(6) දක්ෂිණ භාරතයේ මදුරාසිය, තාන්ජෝරය වැනි ප්‍රදේශවල ප්‍රචලිතව ඇති නර්තන සම්ප්‍රදායකි.
1) භරත 2) කථක් 3) කථකලි 4) මනිපුරි

(7) ගායනයට පෙර තිත වාදනය කිරීම හඳුන්වන්නේ,
1) සමග්‍රහ ලෙසිනි 2) අවග්‍රහ ලෙසිනි 3) විෂමග්‍රහ ලෙසිනි 4) නව ග්‍රහ ලෙසිනි


(8) තිල්ලානා යනුවෙන් හැඳින්වෙන්නේ භාරත නාට්‍යයම් සංදර්ශනයක,
1) ආරම්භයයි 2) වන්නමට සමාන කොටසයි
3) අවසානයයි 4) ජතීස්වරම් සමඟ යන කොටසයි

(9) සරස්වතී මණ්ඩපය කරවන ලද්දේ,
1) අනුරාධපුර යුගයේ දුටුගැමුණු රජතුමා විසිනි
2) පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි
3) පොළොන්නරු යුගයේ නිශ්ශංකමල්ල රජතුමා විසිනි
4) මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසිනි

(10) ස්වභාවික ස්වරූපයෙන් බැහැරව ගීත, සංවාද ආදියෙන් සමන්විත නාට්‍ය විශේෂය හඳුන්වන්නේ,
1) ශෛලීගත නාට්‍ය නමිනි 2) තාත්වික නාට්‍ය නමිනි
3) ගීත නාට්‍ය නමිනි 4) මුද්‍රා නාට්‍ය නමිනි

**අංක 11 සහ 12 ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

(11) අනුපිළිවෙලින් 3, 4, 1 භාණ්ඩ අයත් වන්නේ,



1 2 3 4

1) උඩරට, සරබරගමු, පහතරට නර්තන සම්ප්‍රදායන්ටය.
2) පහතරට, සබරගමු, උඩරට නර්තන සම්ප්‍රදායන්ටය.
3) උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ටය.
4) සබරගමු, උඩරට, පහතරට නර්තන සම්ප්‍රදායන්ටය.

(12) අංක 2 යටතේ ඇති වාද්‍ය භාණ්ඩය අයත් වනුයේ පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ කුමන කොටසටද?
1) ආතත කොටසටය 2) ඝන කොටසටය 3) සුසිර කොටසටය
4) විතත කොටසටය

(13) සකපෝරුව ............................................ කර්මාන්තයේදී භාවිතා කරයි.
1) පතල් 2) වඩු 3) මැටි 4) ධීවර

(14) ''රටකට මව් සමගින් එනැවි නැග යන කල අපේ මුනිඳුන්'' මෙය .................................. කවියකි.
1) ග්‍රහපන්ති 2) සිරසපාද 3) කඩතුරා 4) රබන්

(15) දෙවුන්දර දේවාලයේ පන්සියයක් පමණ හින්දු බාලිකාවන් නර්තනයේ යෙදුන බවට වාර්තා කර ඇත්තේ,
1) ස්පිල් බර්ජන්ය 2) ඉබන් බතූතාය 3) රොබට් නොක්ස්ය 4) පාහියංය

(16) නොඇදෙන අකුරු හෙවත් තනි අකුරු හඳුන්වන්නේ,
1) ලඝු අක්ෂර නමිනි2) ගුරු අක්ෂර නමිනි 3) ප්ලුත අක්ෂර නමිනි 4) මාත්‍රා අක්ෂර නමිනි

(17) තුන් තිතේ ප්‍රභේදයකි.
1) සුළු මැදුම් දෙතිත 2) දෙසුළු මැදුම් තුන්තිත
3) මැදුම් මහ දෙතිත 4) මැදුම් මහ දෙතිත

(18) බෙර වාදනයෙන් තොරව කටින් පද කියමින් අභ්‍යාස කරනු ලබන්නේ,
1) පා සරඹ, ගොඩ සරඹ 2) පා සරඹ, ඉලංගම් සරඹ
3) පා සරඹ, මණ්ඩිපද 4) පා සරඹ, දොඹින පද

(19) කරදිය මුද්‍රා නාට්‍යයේ ''සිසිගේ'' චරිතයට රංගන දායකත්වය ලබා දෙන ශිල්පිනිය වනුයේ,
1) මිරැන්ඩා හේමලතා මහත්මියයි 2) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මියයි
3) ශ්‍රියානි රාජපක්ෂ මහත්මියයි 4) වජිරා චිත්‍රසේන මහත්මියයි

(20) කුම්භී කථාව මුද්‍රා නාට්‍ය ප්‍රථම වරට නිෂ්පාදනය කර ඇත්තේ,
1) 2008 වර්ෂයේදීය 2) 2007 වර්ෂයේදීය
3) 2010 වර්ෂයේදීය 4) 2011 වර්ෂයේදීය

(21) ''හනික වරෙව් කොල්ලනේ'' ගීතය ඇතුළත් නාට්‍ය වනුයේ,
1) විදුර නාට්‍යය 2) බෙර හඬ නාට්‍යය 3) සිංහබාහු නාට්‍යය 4) නරිබෑනා නාට්‍යය

(22) මෙම සංකේත ප්‍රස්ථාරකරණයේ දී මූලධර්ම ලෙස භාවිතා වේ.
1) ∪ +^/ 2) − ∩ / V 3) + V / ^ 4) + − / V

(23) තිත් තිත් තෙයි යනුවෙන් තාලම්පට වාදනය කරනුයේ,
1) තනි තිතේ තාලරූපවලදීය 2) දෙතිතේ තාලරූප වලදීය
3) තුන්තිතේ තාලරූපවලදීය 4) සිව්තිතේ තාලරූපවලදීය

- **ප්‍රශ්න අංක 24 සිට 28 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන ප්‍රශ්න පහ සඳහා සිසුන් හතර දෙනෙකු ලබාදෙන ලද පිළිතුරු වගුවේ දැක්වේ.**

ප්‍රශ්න
(i) කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශයක් නම් කරන්න.
(ii) කථක් නර්තනය පිළිබඳ ග්‍රන්ථ රචනා කළ රජුගේ නම කුමක්ද?
(iii) කථක් නර්තනය සඳහා යොදාගන්නා සංගීත සම්ප්‍රදාය කුමක්ද?
(iv) කථක් නර්තනය සඳහා වාදනය කරන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා තවත් වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න.
(v) කථක් නර්තන අංග 2ක් නම් කරන්න.

| | (i) පිළිතුර | (ii) පිළිතුරු | (iii) පිළිතුර | (iv) පිළිතුර | (v) පිළිතුර |
|---|---|---|---|---|---|
| ආකාශ් | ලක්නව් | නවාබ් වජිද් අලීෂා රජු | උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදාය | මෘදංගය ප්‍රංග් | ආමද් පරන් |
| දිල්කි | මදුරාසිය | රවීන්ද්‍රනාත් තාගෝර් පඬිතුමා | දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය | තබ්ලාව සර්පිනාව | සලාම් තිහායි |
| විහඟ | තාන්ජෝරය | වල්ල තෝල් නාරායන මෙනන් | උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදාය | තබ්ලාව සාරංගිය | ශබ්දම් වර්ණම් |
| නිමේෂා | කේරළය | චින්නයියා | දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය | වෙණ්ඩාව එඩැක්ක | අලාරිප්පු තිල්ලානා |

(24) පළමු ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ලබාදී ඇත්තේ,
1) දිල්කි 2) ආකාශ් 3) නිමේෂා 4) විහඟ

(25) තුන්වන ප්‍රශ්නය සඳහා වැරදි පිළිතුරු ලබාදී ඇත්තේ කවුරුන්ද?
1) දිල්කි සහ නිමේෂා 2) ආකාශ් සහ විහඟ
3) ආකාශ් සහ දිල්කි 4) විහඟ සහ නිමේෂා

(26) නිවැරදි පිළිතුර වැඩිම සංඛ්‍යාවක් ලබාදී ඇත්තේ,
1) විහඟ 2) නිමේෂා 3) ආකාශ් 4) දිල්කි

(27) ප්‍රශ්න සියල්ලටම වැරදි පිළිතුරු ලබාදී ඇත්තේ,
1) නිමේෂා 2) විහඟ 3) දිල්කි 4) ආකාශ්

(28) පිළිතුරු සංඛයාව සමාන වන්නේ,
1) ආකාශ් සහ දිල්කි 2) දිල්කි සහ විහඟ
3) විහඟ සහ නිමේෂා 4) නිමේෂා සහ ආකාශ්

(29) වන්නමක කවිය ගායනා කරන අයුරු දැක්වෙන්නේ,
1) කස්තිරමෙනි 2) බෙර පදයෙනි 3) තානමෙනි 4) තිතෙනි

(30) එකම පුරාවෘත්ත කථාව පසුබිම් කොටගත් නර්තන සම්ප්‍රදායයන් දෙකට අයත් ශාන්තිකර්ම වනුයේ,
1) කොහොඹා කංකාරිය හා කඩවර කංකාරිය
2) කොහොඹා කංකාරිය හා දෙවොල් මඩුව
3) දෙවොල් මඩුව හා හැටපස් මංගල්‍යය
4) දෙවොල් මඩුව හා පහන්මඩුවය

## II කොටස (උඩරට නර්තනය)

(31) නමවන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,
1) පැනීමේ සරඹය 2) චන්ද්‍රිකා සරඹය 3) දැල සරඹය 4) දෑත පෑගීමේ සරඹය

(32) උඩරට නර්තන සම්ප්‍රදායේදී පමණක් භාවිත වන වචන වේ.
1) බර, සරඹ, තානම, කණ්ඩිලම 2) සීරුමාරුව, තීරුමානම, කස්තිරම, අඩව්ව
3) කස්තිරම, ඕඩිය, ගොඩසරඹ, සීරුමාරුව 4) කස්තිරම, ගොඩසරඹ, අත්සරඹ, අඩව්ව

(33) ''ගසමින් කගපතින් - දෙපලුව අසුරසෙන්'' මෙම කවි පදය ඇතුළත් වන්නේ,
1) සැවුලා වන්නමටය 2) සිංහරාජ වන්නමටය
3) වෛරොඩි වන්නමටය 4) තුරඟා වන්නමටය

(34) තත් කකට තක රොං... යනු
1) කස්තිරමකි 2) අඩව්වකි 3) සීරුමාරුවකි 4) කලාසමකි

(35) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන ශිල්පියෙකි.
1) කේ.ඇස්. ප්‍රනාන්දු මහතා 2) එස්.එල්.එච්. ප්‍රනාන්දු මහතා
3) ජී.වී. හීන්තිලමෙ මහතා 3) එස්. පණීභාරත මහතා

(36) ''දුරත් බැලුම නොව ළඟත් බලන අය....'' මෙම කවිය සඳහා වාදනය කළ හැකි බෙර පදය වනුයේ,
1) දොං ජිජි ගතය 2) දොදොම්ත තකු දොම්ය
3)දොං දොං ජිං ජිං කිටිතකය 4) දොං ජිංත ගත දොංතය

(37) තාම් දොමිති ගත දොම්කිට ........................... කිතක දොමිති ගත ....................... තාකු ජිත්ත ගත .................................. කුංදත් තා'' යන්නෙහි හිස්තැන් වලට ගැළපෙන පද කොටස් තෝරන්න.
1) කඩතක කුංදත්, තරිකිට කුද කුද, තරිකිට දොම්කිට
2) කඩතක දොම්කට්, දොමිත දොමිත ගත, කුදගත තරිකිට
3) කඩතක තරිකිට, කිත්තත් කුද කුද, දොම්කිට තරිකිට
4) තක්කඩ කඩතක, තරිකිට දොම්කිට, කුද ගත කුද ගත

(38) අවුල් හැරය, පායිම්පත, කෛමෙත්ත යන රංග වස්ත්‍ර අයත් වන්නේ,
1) වෙස් ඇඳුම් කට්ටලටයටය 2) පංතේරු ඇඳුම් කට්ටලයටය
3) තෙල්මෙ ඇඳුම් කට්ටලයටය 4) උඩැක්කි ඇඳුම් කට්ටලයටය

(39) උඩරට වන්නමකට අයත් කොටස් ගණන,
1) තුනකි 2) හතරකි 3) පහකි 4) හයකි

(40) ගැටබෙරයෙහි කොටස් දෙකක් වන්නේ,
1) මණ්ඩම හා සුරත්තට්ටුව 2) මණ්ඩම හා අඩබෑය
3) කෙපුඩි වලල්ල හා සුරත්තට්ටුව 4) වලයම හා සුරත්තට්ටුව

## III කොටස (පහතරට නර්තනය)

(31) තරිකඩ දිරි කඩ යනු,
1) එකොළොස්වන ඉලංගම් සරඹයයි
2) දොළොස්වන ඉලංගම් සරඹයයි
3) හයවන ඉලංගම් සරඹයයි
4) නමවන ඉලංගම් සරඹයයි

(32) පහතරට නර්තන සම්ප්‍රදායේදී පමණක් භාවිතා වන වචන වේ.
1) අන්තාඩිය, කලාසම, කස්තිරම
2) ඉලංගම් සරඹ, සරල කවි තාල, සුරල
3) අන්තාඩිය, ඉරට්ටිය, ඉලංගම් සරඹ
4) ඉලංගම් සරඹ, සිංදු වන්නම්, අඩව්ව

(33) ''සඳ සන්දර දිගු පුන් ගිර දිළිමන් පොබ යසටා'' මෙම කවි පදය ඇතුළත් වන්නේ,
1) නාතිලිංචි තාලයටය
2) අනුරාග දණ්ඩතාලයටය
3) හනුමන්තා තාලයටය
4) ඊශ්වර කුණ්ඩ තාලයටය

(34) ''ගුංදත් ගුහිති ගදිරිකිට ගත ගත ගහිති ගතම්...'' යනු,
1) අන්තාඩියකි
2) ඉරට්ටියකි
3) අඩව්වකි
4) කලාසමකි

(35) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන ශිල්පියෙකි.
1) එස්. පණීභාරත මහතා
2) චිත්‍රසේන ඩයස් මහතා
3) ජී.වී. හීන්නිලමේ මහතා
4) කේ.ඇස්. ප්‍රනාන්දු මහතා

(36) ''තාරඟනා මැදිනා දිසි සුබුකරා ලෙස...'' මෙම කවිය සඳහා වාදනය කළ හැකි බෙර පදය වනුයේ,
1) දොංදොං දොං ගදිකිට ගදිත දොදොං ත ය.
2) තකදිත් තක දොං දොං දිං තක දොං ය.
3) ගතිකිට ගත දොං ගුදි කිට ගත දොං ය.
4) දිං ගදිගතං දොංතය.

(37) තක දිත් තක දොං ............................ තරිගත දිකු දං ......................... තකු තත් ....................... තා
1) කිටිතක කුද ගත, දොමිත තකුද ගත, තරිකිට කුද ගත
2) කිත් තත් කුද ගත, ගුදිත ගදිත ගත, ගුං දත්
3) කිත්තත් කිටිතක, දොමිත දොමිත ගත, ගුහිති ගදිරිකිට
4) දොමිත දොමිත ගත, කිටිතක කිත්තත්, ගුහිති ගදිරිකිට

(38) නළල් පටිය, පබළු හැට්ටය, අත්පටි යන රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ,
1) තෙල්මෙ ඇඳුම් කට්ටලයටය
2) දෙවොල් ඇඳුම් කට්ටලයටය
3) පත්තිනි ඇඳුම් කට්ටලයටය
4) වාහල ඇඳුම් කට්ටලයටය

(39) පහතරට වන්නමකට අයත් කොටස් ගණන
1) තුනකි
2) පහකි
3) හයකි
4) හතරකි

(40) පහතරට බෙරයේ කොටස් දෙකක් වන්නේ,
1) කංවරය හා බෙර පුහුල
2) කෙපුඩි වලල්ල
3) හයි පැත්ත හා සුරල් පැත්ත
4) මංඩම හා අඩබෑය

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம්

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - නර්තනය | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ........................................................................................................................

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) i) ''අතකට ගෙන රබන් පොඩිය'' යන කවිය .............. තනි තිතට ගායනා කළ හැකිය.

ii) සොකරි රඟ මඩල ..................................... වේ.

iii) පරාක්‍රමබාහු රජු විසින් සෙබළුන්ගේ ආශ්වාදය පිණිස නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වූ බව .............................. සඳහන් වේ.

iv) ''උඩරට නර්තන කලාව'' ග්‍රන්ථය රචනා කරන ලද්දේ .............................. මහතාය.

v) අතීතයේදී පඬුවස්දෙව් රජුට වැළඳුණු දිවිදොස් සුවපත් කර ගැනීමට ........................................ ශාන්තිකර්මය පවත්වන ලදී.

vi) ''විදෙන ලෙලෙන නරුබර පුළුලුකුල රැදී.......'' යන කවිය ........................................ සංදේශයේ එන කවියකි.

vii) භරත නාට්‍යම් හි නැටුම්, ගැයුම්, වැයුම් යන අංගයන්හි දැනුම ඇති ගුරුවරයා හඳුන්වන නාමය වනුයේ ........................................ ය.

viii) ගොයම් කැපීමේ නැටුම වේදිකාව සඳහා නිර්මාණය කරන ලද්දේ ........................ විසිනි.

ix) පහත සඳහන් භාරතීය නර්තනවලට යොදා ගන්නා සංගීත සම්ප්‍රදායයන් නම් කරන්න.

අ) ජතීස්වරම්, අලාරිප්පු -

ආ) තිහායි, පරන් -

x) මහනුවර දළදා පෙරහැර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ දේශසංචාරකයින් දෙදෙනා වනුයේ,

අ) ..................................................................

ආ) ..................................................................

(02) i) පහත දැක්වෙන බෙර පද අතුරෙන් ඔබ පාසලේ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරාගෙන අදාළ තිතට ප්‍රස්ථාර කරන්න.

- දොං දොං ජිං ජිං ගජිගත
- දොම් තම් ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතම්

ii) මාත්‍රා 3 තනිතිතට පන්නෙළීමේ කවියක් ප්‍රස්ථාර කරන්න.

iii) මාත්‍රා 2+3 තාල රූපයට කස්තිරමක්/ඉරට්ටියක් ප්‍රස්ථාර කරන්න.

(03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i) ත්‍රිවිධ ලය ii) සිරසපාද කවි iii) ගැමි නැටුම්

iv) දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩ v) මණ්ඩිය

(04) ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණයේදී උපයෝගී කරගත හැකි මූලාශ්‍රය වර්ග කීපයක් යටතේ සාකච්ඡා කළ හැකිය.

i) ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳව සෙල්ලිපි 2ක් ආශ්‍රයෙන් තොරතුරු ඉදිරිපත් කරන්න.

ii) ගම්පළ යුගයේ රචිත සංදේශ කාව්‍යයක් නම් කර එම සංදේශ කාව්‍යයේ වාද්‍ය භාණ්ඩ පිළිබඳව තොරතුරු සඳහන් වන කවිය ලියන්න.

iii) ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳව මහා වංශයේ සඳහන් සාධක 2ක් ලියන්න.

(05) පහත සඳහන් රූපරාමු උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



1



2



3

A



1



2

B

i) A කොටසේ 1, 2, 3 රූපරාමු නම් කරන්න.

ii) 1 රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය

- ප්‍රචලිත ප්‍රදේශ 2 ක්
- නර්තන අංග 2ක්
- සංගීත සම්ප්‍රදාය හා උගන්වන ආයතනයක්
- රංගවස්ත්‍රාභරණ කොටස් 2ක් ලියන්න.

iii) B කොටසේ 1 හා 2 අංකවලින් දැක්වෙන මුද්‍රා නාට්‍ය දෙක නම් කර ඉන් එකක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

(06) දේශීය ජන නාටක අතර සොකරි ජන නාටකයට සුවිශේෂ ස්ථානයක් හිමිවේ.

i) සොකරි ජන නාටකයේ චරිත 4ක් නම් කරන්න.

ii) එක් චරිතයකට අදාළ කවියක් ලියන්න.

iii) සොකරි වර්ග තුන නම්කර ඉන් ඔබ කැමති වර්ගයකට අයත් වාද්‍ය භාණ්ඩය ඇඳ කොටස් දෙකක් නම් කරන්න.

(07) ඔබ පංති කාමරයේදී උගත් වෘත්තීන් තේමා කරගත් නර්තන නිර්මාණය පාඩම ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) පංතිකාමරයේදී උගත් වෘත්තීන් තේමා කරගත් නර්තන අතරින් ඔබ කැමති 4ක් නම් කරන්න.

ii) එක් වෘත්තියක් නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න.

iii) වෘත්තීන් සඳහා නර්තන නිර්මාණකරණයේදී සැලකිලිමත් වියයුතු කරුණු 4ක් දක්වන්න.

# 10 ශ්‍රේණිය - නර්තනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 3 | (21) 2 | (31) 4 |
| (2) 2 | (12) 4 | (22) 1 | (32) 3 |
| (3) 3 | (13) 3 | (23) 3 | (33) 1 |
| (4) 3 | (14) 4 | (24) 2 | (34) 2 |
| (5) 1 | (15) 2 | (25) 1 | (35) 4 |
| (6) 1 | (16) 1 | (26) 3 | (36) 2 |
| (7) 2 | (17) 2 | (27) 1 | (37) 3 |
| (8) 3 | (18) 3 | (28) 2 | (38) 1 |
| (9) 2 | (19) 4 | (29) 3 | (39) 4 |
| (10) 1 | (20) 2 | (30) 4 | (40) 3 |

(ලකුණු 1x 40 = 40)

## II පත්‍රය

(01) i) මැදුම්/මාත්‍රා 3
ii) කමත
iii) චූල වංශයේ
iv) ජේ.ඊ. සේදරමන්
v) හැටපස් මංගල්‍යය
vi) සැළලිහිණි
vii) නටුවනාර්
viii) එස්. පණීභාරත මහතා
ix) අ) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය
ආ) උත්තර භාරතීය හිංදුස්ථානි සංගීත සම්ප්‍රදාය
x) අ) රොබට් නොක්ස්
ආ) ස්පිල් බර්ජන්

(ලකුණු 1x12 = 12)

(02) i)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | / | | | | ^ | | / | | | |
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| දොං | - | ජිං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | / | | | | ^ | | / | | | |
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| දොම් | - | තම් | - | ග | ත | ග | දි | තම් | - | ග | ත |
| ගු | ගු | දම් | - | ග | ත | ග | දි | තම් | - | - | - |

(ලකුණු 4)

ii)

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ගා | - | න | තෙල් | - | ස | දුන් | - | ව | ර | ල | ස |
| ඔ | ම | රි | කො | ට | - | - | - | - | - | - | - |
| මු | - | ණ | පු | රා | - | තෙල් | - | ගා | - | ගෙ | න |
| ය | න | ක | ල | ට | - | - | - | - | - | - | - |
| මා | - | න | බ | ල | ති | මි | ණි | ව | න් | පන් | - |
| ති | බෙ | න | කො | ට | - | - | - | - | - | - | - |
| නෑ | - | නෙ | නු | ඔත් | - | එ | න | ව | ද | පන් | - |
| නෙ | ලන් | - | න | ට | - | - | - | - | - | - | - |

(ලකුණු 4)

iii)

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| කු | ද | ග | ජි | ත | කු | ද | ග | ජි | ත |
| කු | ද | ග | ජි | ත | කු | ද | තා | - | - |
| කු | ද | ග | ජි | ත | කු | ද | ග | ජි | ත |
| කු | ද | ග | ජි | ත | කු | ද | තා | - | - |
| කු | ද | ග | ජි | ත | කු | ද | තා | - | - |
| කු | ද | ග | ජි | ත | කු | ද | තා | - | - |
| කු | ද | තා | - | - | කු | ද | තා | - | - |
| කු | ද | ග | ජි | ත | කු | ද | ග | ජි | ත |
| කු | ද | ග | ජි | ත | කු | ද | තා | - | - |

(ලකුණු 4)

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දිං | - | ග | ති | ග | තම් | - | දොං | - | ත |
| ග | ත | ගති | තිග | තම් | තත් | - | තත් | - | - |
| ගු | ද | ග | ති | ග | තම් | - | දොං | - | ත |
| ග | ත | ගති | තිග | තම් | දොම් | - | දොම් | - | - |

(ලකුණු 4)

(කස්තිරම / ඉරට්ටිය යන දෙකෙන් එකක පමණක් ලකුණු එකතු කරන්න)

(3x4 = 12)

(03) i) ත්‍රිවිධ ලය

යම් කිසි තාලයක ඇති කාලයේ වේගය ලය නමින් හඳුන්වනු ලැබේ. ඒ අනුව තාලය හා ලය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධව පවතියි. ලය ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය.

1. විලම්භ ලය (සමගුණ)
2. මධ්‍ය ලය (දෙගුණ)
3. ද්‍රැත ලය (සිව්ගුණ)

මෙය සමගුණ, දෙගුණ, සිව්ගුණ වශයෙන්ද හැඳින්වේ. ඉතා අඩු වේගය විලම්භ ලය වේ. විලම්භ ලයෙහි දෙගුණය මධ්‍ය ලය වේ. විලම්භ ලයෙහි සිව්ගුණය හෙවත් මධ්‍ය ලයෙහි දෙගුණය ද්‍රැත ලයවේ.

| | / 1 | 2 | / 1 | 2 | / 1 | 2 | / 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|
| විලම්භ | දො | මි | කි | ට | කි | ට | දො | මි |
| මධ්‍ය | දොමි | කිට | කිට | දොමි | දොමි | කිට | කිට | දොමි |
| ද්‍රැත | දොමිකිට | කිටදොමි | දොමිකිට | කිටදොමි | දොමිකිට | කිටදොමි | දොමිකිට | කිටදොමි |

(ලකුණු 4)

ii) සිරසපාද කවි

දේශීය නර්තන සම්ප්‍රදායයන් තුනටම පොදු සහ ආවේණික වූ සිරසපාද කවි ඇති අතර ඒවා සාම්ප්‍රදායික නාදමාලා අනුව ගායනා කරනු ලබයි. මෙම කවි ආසාතාත්මක ගායනයන් ලෙස සැලකිය හැකිය. රෝගයකට බඳුන් වූ පුද්ගලයෙකුගේ (ආතුරය) හිසේ සිට දෙපතුල තෙක් පවතින්නා වූ සියලුම දෝෂ දුරුවේවා! යැයි කියා සෙතක් ශාන්තියක් සැලසීම අරමුණු කොටගෙන ගායනා කරනු ලබන සිරස පාද කවි ශාන්තිකර්ම ආශ්‍රිත ගායනා විශේෂයකි.

සොලසා සංඛය පළමුව පෙරුම් පිරූ      බලයෙන් දා
මෙලෙස මුණිඳු වජ්‍රාසන වැඩ ඉඳ කෙලෙසුන්      සින් දා
කලස රැගෙන මිහිකත දෙස් කී අනුහස්      බලයෙන් දා
සිරස නළල පැමිණි දෝස දුරලන් මුණි      බලයෙන් දා

(ලකුණු 4)

iii) ගැමි නැටුම්

ගැමි ජනයා විසින් නිර්මාණය කරගත් නැටුම් විශේෂයක් ලෙස ගැමි නැටුම් හඳුන්වාදිය හැකිය. මෙය ලෝකයේ සෑම ජන කොටසකටම පොදු වූවකි. දේශීය ගැමි නැටුම් හා සමාන ද්‍රවිඩ ගැමි නැටුම් ද ඇත. සරල බව, සාමූහික බව, එමකම යනාදී සුවිශේෂී ලක්‍ෂණ දක්නට ඇති අතර ජීවන වෘත්තීන් හා විනෝදාස්වාදය පෙරදැරිව ගැමි නැටුම් නිර්මාණය වී ඇත. ගැමි නැටුම්වලදී උපකරණයක් අතින් රැගෙන නර්තනය කිරීම හා කවි ගායනා කිරීම දක්නට ලැබේ. ඇඳුම් පැළඳුම් ගායනයට සරලය. දේශීය වශයෙන් කුළු නැටුම, ලී කෙළි නැටුම, පතුරු නැටුම, කළගෙඩි නැටුම, කඩු නැටුම ආදී නැටුම් දැකගන්නට ලැබේ.

කළගෙඩි කවි

පේළි සැදී අඟනෝ      සැරසීලා
නීලවරළ කුසුමන්      ගවසාලා
කෝලනොවී සබ මැදට      වැදීලා
බාල ලියෝ කළ පිබිති      සැදීලා

කුළු කවි

ඈත සිටන් එන්නි සෙල්ලි      සෙල්ලියේ
මෑත සිටන් එන්නි සෙල්ලි      සෙල්ලියේ
කරේ බැන්ද පවලම් වැල      නොසෙල්ලියේ
කුළු සරඹෙට එනවද රත්න      වල්ලියේ

(ලකුණු 4)

iv) දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩ

සම් යොදා සකස් කර ගන්නා වාද්‍ය භාණ්ඩ අවනද්ධ වාද්‍ය භාණ්ඩ නමින් හඳුන්වනු ලැබේ. දේශීය වාද්‍ය භාණ්ඩ වැඩි ප්‍රමාණයක් මෙම ගණයට අයත් වේ. ගැටබෙරය, දෙවොල්බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන ආදිය අවනද්ධ භාණ්ඩ ලෙස නම් කළ හැක.

දේශීය අවනද්ධ භාණ්ඩවලට ආවේණිකව බෙර පද ගොඩ නැගී ඇත.

උදා :-

| | |
|---|---|
| උඩරට | - දොම්කිත කිත දොම්, දොං ජිජි ගත, කුදට ගතට කුදට ගජිං |
| පහතරට | - රුදකිට තත් දොම්, දෙගත් ගතකු දොම්, ගුංද දෙගත ගදිගත ගුද |
| සබරගමු | - ජිං කිට තත් තත් කිටිතක |

(ලකුණු 4)

v) මණ්ඩිය

දේශීය නර්තන සම්ප්‍රදායයන්ගේ මූලික අංගහාරය හෙවත් ඉරියව්ව මණ්ඩියයි. නැතහොත් නැටුමට සූදානම් වීමේ මූලික ඉරියව්වයි. එනම් නර්තන ශිල්පියා දෙපතුල් හා දෙදණ දෙපසට විහිදුවා නිසි පරිදි දෙදණින් නැමී ඇති කරගන්නා නර්තන ආරම්භක පියවරයි. මණ්ඩිය යනු සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයේ සිදු කෙරෙන ක්‍රියාකාරකම්වලට වෙනස් වූ පියවරකි. මණ්ඩිය සකස් කර ගැනීමට දණ්ඩි කඳ නම් විශේෂිත වූ ආධාරකයක් භාවිතා කරයි. දේශීය නර්තන සම්ප්‍රදායන්වලදී මෙන්ම ඉන්දීය නර්තන සම්ප්‍රදායන් වලද මණ්ඩිය යන නම භාවිතා කරයි. මණ්ඩියට පහත් වූ විට කකුල් දෙක අතර පරතරය මිටි රියනකි. භාරත නාට්‍යම්වලදී මණ්ඩිය ''අර මණ්ඩිය'' නමින් හඳුන්වනු ලබයි. ඒ ඒ සම්ප්‍රදායන් අනුව මණ්ඩියේ යම් යම් වෙනස්කම් දක්නට ලැබේ.

(ලකුණු 4)

(3x4 = 12)

(04) i) ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණයේදී උපයෝගී කරගත හැකි මූලශ්‍ර ගණනාවකි. ඒ අතරින් සෙල්ලිපි වලට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි.

| | | |
|---|---|---|
| සැස්සේරුව සෙල්ලිපිය | - | නටන ගහපතියා විසින් පවරාදෙන ලදී යනුවෙන් සඳහන් වේ. |
| කොරවක්ගල ලෙන්ලිපිය | - | නටන ගහපතියාගේ දුව විසින් පවරාදෙන ලදී යනුවෙන් සඳහන් වේ. මේ අනුව ගහපතියා නමින් නැටුම් පරම්පරාවක් සිටින්නට ඇතැයි අනුමාන කළ හැකිය. |

(ලකුණු 4)

(මීට අමතරව පාලමොට්ටායි සෙල්ලිපිය, ගල් ආසන ලිපිය යනාදියේ ඇති තොරතුරු ද යොදාගත හැකිය)

ii) ගම්පළ යුගයේ රචිත සංදේශ කාව්‍යය - තිසර සංදේශය (ලකුණු 1)

වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සඳහන් කවිය :-

තහලම් කළබෙර තම්මැට පට තන්තිරි ඔමුරු
තඹමේ ඩැක බෙර බොම්බිලි වීණා මිනි රුසිරු
බෙර මද්දල තහලම් රසු නිගලම් බඳ සොඳුරු
මෙසියල් මහ ගිගුමෙන් පළ කරමින් සිදු අයුරු

(ලකුණු 4)

iii) * විජය හා කුවේණි එක් වූ දින රාත්‍රියේ සිරිසවත්පුරයේ පැවති විවාහ මංගල උත්සවයක නැටුම්, තූර්ය වාදන හා ගීත ගායනා පැවැත්වී ඇත.

* උත්සව අවස්ථාවලදී පණ්ඩුකාභය රජු චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් උදෙසා සම අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව.

(මේ ආදී වශයෙන් කරුණු දෙකක් ලියා ඇත්නම්) (ලකුණු 4)

(ලකුණු 3x4=12)

(05) i) 1 - භාරත නාට්‍යම් සම්ප්‍රදාය (භරත ඇඳුම් කට්ටලය)

2 - මෘදංගය

3 - තංජාවූර් සහෝදරයින් (ලකුණු 4)

ii) 1 රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය - භරත නාට්‍යම්
ප්‍රචලිත ප්‍රදේශ - මදුරාසිය, තාන්ජෝරය 1
නර්තන අංග 2 ක් - අලාරිප්පු, ජතිස්වරම් ආදී වශයෙන් 1
සංගීත සම්ප්‍රදාය - දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය
උගන්වන ආයතනය - අඩයාර්හි කලා ක්ෂේත්‍රම් 1
රංග වස්ත්‍රාභරණ 2 ක් - චන්ද්‍ර පිරෙයි, සූර්ය පිරෙයි ආදී වශයෙන් 1

(ලකුණු 4)

iii) 1 - කරදිය මුද්‍රානාට්‍ය
2 - කුඹී කථාව මුද්‍රා නාට්‍ය 1

* කරදිය හෝ කුඹී කථාව මුද්‍රා නාට්‍ය දෙකෙන් එකක් විස්තර කර ඇත්නම් ලකුණු 3 කි.
(ලකුණු 4)

(ලකුණු 3x4 = 12)

(06) i) ගුරුහාමි (ආඬි ගුරු), සොකරි, වෙදරාළ, පරයා (ලකුණු 4)

ii)

සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ලැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුණ බලන්නී

(ආදී වශයෙන් චරිතයකට අදාළ ඕනම කවියක්)

(ලකුණු 4)

iii) උඩරට සොකරි
වන්නි සොකරි
ඌව සොකරි (ලකුණු 1)

ගැටබෙරය, උඩැක්කිය හෝ දවුල යන වාද්‍ය භාණ්ඩ 3න් 1ක් ඇඳ කොටස් 2ක් නම් කර ඇත්නම් (ලකුණු 3)

(ලකුණු 4)

(ලකුණු 3x4=12)

(07) i) ධීවර කර්මාන්තය, මැටි කර්මාන්තය, පතල් කර්මාන්තය, තේ කර්මාන්තය, කොහු කර්මාන්තය, කෘෂි කර්මාන්තය (ලකුණු 4)

ii)

- ප්‍රථමයෙන් අම්බරුවන් යොදාගෙන කුමුර හාන ආකාරය ඉදිරිපත් කිරීම.
- මඩකෙටීම.
- වී වැපිරීම හෝ පැළ සිටුවීම.
- පැළ නඩත්තුව (පොහොර දැමීම)
- අස්වනු නෙළීම / බැත ගෝනීවලට පිරවීම.
- වී හුළං කිරීම / වෙළීම.
- ගබඩා කිරීම.
- අලෙවිය හා සතුටු වීම.

(ලකුණු 4)

iii)

- අදාළ තේමාවට අනුව ක්‍රියාකාරකම් ගොඩනගා ගැනීම.
- එම සිද්ධියට අදාළ චරිත හා සිදුවීම් හඳුනා ගැනීම.
- සිද්ධියට අදාළ චලන නිරූපණය කිරීමට අවශ්‍ය තාල, රිද්ම අනුව වාදන නිර්මාණය කර ගැනීම.
- ආරම්භය, මැද හා අවසානයේ වන සිදුවීම්වල ස්වභාවය ඉස්මතු කිරීම සඳහා සුදුසු නර්තන චලන හා ඉරියව් නිසි පරිදි භාවිතයට ගැනීම.

(ලකුණු 4)

(ලකුණු 3x4 = 12)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න